# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

## සම්බන්ධීකරණ නිලධාරීන් බඳවාගැනීම

විදේශ රැකියා සඳහා පුහුණු ශ්‍රමිකයින් යොමු කිරීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ග්‍රාමීය මට්ටමේ තරුණ තරුණියන් දැනුවත් කිරීම පිණිස රත්නපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරනු ලබන නියමු ව්‍යාපෘතියක් සඳහා සම්බන්ධීකරණ නිලධාරීන් බඳවාගැනීම සඳහා පහත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

බඳවා ගැනීමේ සුදුසුකම් හා කොන්දේසි :

1. අයදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් 05 ක් සම්මාන සාමාර්ථ 03 ක් සහිතව සමත්ව තිබිය යුතුය.
2. අයදුම්කරුවන් වයස අවුරුදු 59 නොඉක්මවිය යුතුය.
3. මෙම නියමු ව්‍යාපෘතියට වසරක කොන්ත්‍රාත් කාලසීමාවක් සඳහා නිලධාරීන් බඳවාගනු ලබන අතර, රත්නපුර දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන්හට ඉහළ ප්‍රමුඛත්වයක් ලබාදෙනු ලැබේ.
4. මෙම නියමු ව්‍යාපෘතියේ සේවය සඳහා බඳවාගන්නා පුද්ගලයින් ක්ෂේත්‍ර රාජකාරී කටයුතු වල නියුතු විය යුතු බැවින් පිරිමි අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛත්වයක් ලබාදෙනු ලැබේ.
5. තෝරා ගන්නා අයදුම්කරුවන් රත්නපුර දිස්ත්‍රික්කයෙහි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.
6. තෝරා ගන්නා අයදුම්කරුවන් සඳහා සියළු දීමනා සහිතව රු. 30,000/- ක මාසික දීමනාවක් කාර්යාංශය විසින් ගෙවීමට කටයුතු කරනු ලැබේ.
7. මෙම නියමු ව්‍යාපෘතිය රත්නපුර දිස්ත්‍රික්කය කේන්ද්‍රගත කරගනිමින් ග්‍රාමීය මට්ටමේ තරුණ තරුණියන් පුහුණු ශ්‍රමිකයින් ලෙස විදේශ රැකියා සඳහා යොමු කිරීම වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහනක් බැවින් ප්‍රජා සත්කාරක සේවා වැඩසටහන්, ස්වේච්ඡා සේවාවන්හි නියුක්ත අයදුම්කරුවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.
8. මෙම නියමු ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට නියමිතව ඇති බැවින් සම්මුඛ පරීක්ෂණ කෙටි කාලසීමාවක් ඇතුලත පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.
9. අයදුම්කරුවන් අයදුම්පත්‍ර පිළියෙල කිරීමේදී තම විද්‍යුත් තැපැල් ලිපිනය හෝ දුරකථන අංකය අයදුම්පත්‍රයෙහි සඳහන් කළ යුතුය.

ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තමන් විසින් පිළියෙල කරන ලද අයදුම්පත් 2016.01.11 වන දින ප.ව. 1.00 ට පෙර කළමණාකරු - පරිපාලන හා මානව සම්පත් වෙත විද්‍යුත් තැපැල (විද්‍යුත් තැපැල් ලිපිනය: mgr_adhr@slbfe.lk) මඟින් යොමු කළ යුතුය.

සාමාන්‍යාධිකාරි
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
**234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත**
**කොස්වත්ත, බත්තරමුල්ල**
**දුරකථන අංකය : 0112864127**